# ඓතිහාසික කලා සංකේත රූපාවලිය තුළ ප්‍රමුඛ සඳකඩපහණෙහි ප්‍රකටීභූත සංජානනමය ප්‍රතිරූපණය පිළිබඳ සංඥාර්ථවේදී විමසුමක්


සේන නානායක්කාර



## Abstract

*The historical art symbols depict the path of the civilization that has been taken by any given country. It is the foundation for retrospective research on the social, economic and political changes that have been simultaneously taken place in the past. Further, it mirrors the picture interwoven with the historical and archaeological evidence of the bygone ages. If we are to reach the 21st century or any progress even beyond we should constantly cast our retrospective vision over these historical and archaeological objects so far preserved. Up to recent times, the action on this aspect has been at its lowest ebb. Therefore, this research on the symbolism of moonstone is directed to fulfill this lacunae. The objective of the present study therefore, is to re-examine the symbolism that associated with the moonstone, the artifact eternally appreciated in the arena of Sri Lankan art history.*

*If we consider the representations expressed and ideology of symbolism are two different subjects. However, primarily they both belong to the field of communication based on social psychology. Therefore, the methodology of the present study is focused to examine the folklore and other literature associated with the moonstone over the past centuries. The historical sources are rich in evidence and material for any historical research on this subject. The moonstone is not only an ancient artifact but also a representation of the identity of the nation in the field of art history. Accordingly, the present study would bring about an acceptable addition to the existing knowledge on this subject.*



**Key words:** Identification, Representation, Folklore, Symbolism, Social Spectrum.



**Author Details:** ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
senananayakkara@gmail.com/0718101539



**Citation:** නානායක්කාර, සේන (2013), ඓතිහාසික කලා සංකේත රූපාවලිය තුළ ප්‍රමුඛ සඳකඩපහණෙහි ප්‍රකටීභූත සංජානනමය ප්‍රතිරූපණය පිළිබඳ සංඥාර්ථවේදී විමසුමක්, The Journal of Archaeology and Heritage Studies, 1(1)


## හැඳින්වීම

මානවයාගේ සම්භවය සහ ක්‍රමික විකාශනය අතරතුර ගතවූ කාල පරිච්ඡේදය විමර්ශනයේ දී විශේෂතා රැසක් විද්‍යමාන වෙයි. නිර්මාණශීලී ලෙස කල්පනා කළ නොහැකි හුදු වානරයෙක් වෙනුවට, ශතක සංඛ්‍යාත ශක්‍යතාවන්ගෙන් සපිරි නිර්මාණශීලී බුද්ධිමත් මානවයාගේ බිහිවීම එකී විශේෂතා සියල්ලට පදනම සකසන්නක් විය. ආහාර සොයායෑම, ප්‍රජනන කාර්යය හා ආරක්ෂාවේ අපේක්ෂාව ආදී මුල්කාලීන අවශ්‍යතාවන්ට ඔබ්බෙන් පැනනැගුණු සෙසු සකලවිධ උපයෝගීතාවන් කරණකොටගෙන ගොඩනැඟුණු සමාජීය කටයුතු එහි දී ප්‍රමුඛ වන්නට වූ බව පෙනේ.

සාම්ප්‍රදායික ගෝත්‍රික සමාජයෙන් දුරස්ව ප්‍රගතිගාමී මානව සමාජයක සංලක්ෂණ සහිත සක්‍රිය මානවයෙක් බිහිවන්නට වූයේ එ පරිද්දෙන් බව පැහැදිලි ය. විද්‍යාව, කලාව හා සෙසු සංවර්ධනශීලී විෂය ක්ෂේත්‍රයන් මිනිස් ප්‍රජාව විෂයයෙහි ලා අලුතින් එකතුවන්නේ එ බැවිනි. එතෙක් අවිධිමත් ලෙස, අක්‍රමත්ව මෙන්ම සංකීර්ණව

ඉටුකෙරුණු කාර්යභාරයන්, ඉන් පසුව වඩාත් විධිමත්ව, ක්‍රමවත්ව මෙන්ම සරලව හා සුමටව කෙරෙන මිනිස් ක්‍රියාකාරකම් බවට පත්වන්නේ ඒ අනුව ය. විද්‍යාව හා කලාව විසින් මිනිස් පරපුරේ අතීතය, වර්තමානය හා අනාගතය තීරණය කරනු ලබනුයේ එ පරිද්දෙනි.

ආගම හා සංස්කෘතිය ද එ සේම ය. දේශපාලනය ඊටම ආනුෂාංගික තවත් විෂය ක්ෂේත්‍රයකි. මේ කවර කාරණාවක දී වුව සලකා බැලෙනුයේ ඒ හා සමගාමී වන සමාජ සම්බන්ධතාව යි.

ඓතිහාසික කලා සංකේත යනු එ බඳු දෘඪතර සමාජ සම්බන්ධතාවලින් ක්‍රියාත්මක, එල විශේෂයයක් යැයි අර්ථ දක්විය හැකිය. කිසියම් දේශයකට, මිනිස් ප්‍රජාවකට හෝ සමාජ කොට්ඨාසයකට ආවේනික හෝ උරුම, එබඳු කලා සංකේත රූපාවලියක් වෙත්නම්, එය එකී සමාජයේ ඓතිහාසික වර්ධනය සනිටුහන් කරන විශිෂ්ටත්වයේ මං සලකුණු ලෙස ගැනේ. ඒවායෙහි සංජානනමය ප්‍රතිරූපණ පිළිබඳ සංඥාර්ථ විද්‍යාත්මකව විමසා බැලීම වඩාත් කාලෝචිත වනුයේ, සංජානනය හා සංඥාර්ථවිද්‍යාවත් කාලානුරූපව වඩාත් ගැඹුරින් විග්‍රහ කිරීමේ අවශ්‍යතාව මතුව ඇති බැවිනි. මිනිස් ප්‍රජාවේ උරුමය සම්බන්ධයෙන් ගත්කල එය වඩාත් වැදගත් වනු ඇත.

ක්‍රමවේදය

මෙම අධ්‍යයනයෙහිලා ප්‍රස්තුත කොට ගැනෙන කලා සංකේත, වචනයේ පරිසමාප්තාර්ථයෙන්ම ඓතිහාසික සමාජ ක්‍රියාවලියෙහි මහරු එල ලෙස නම් කෙරේ. කවර දෘෂ්ටිකෝණයකින් හෝ කවර විෂය ක්ෂේත්‍රයකින් හෝ එය විමර්ශනයට ලක්කිරීම ඉතිහාසය ගැඹුරින් ගවේෂණය කරන්නක් විය යුතුය. කලා කෘති ද්‍රව්‍යමය වුව ඒ පිළිබඳ නිර්මිත ජනශ්‍රැති හා සම්ප්‍රදායයන් ද සපුරා සාහිත්‍යමය වෙයි.

ඉතිහාසය හා පුරාවිද්‍යාදී අතීත ගවේෂක විෂය ප්‍රපංචයන්හි ආනුෂාංගික කාලානුරූප සමාජ වටිනාකම් හා නිර්නායකයන් ද අධ්‍යයනය කළ හැක්කේ එකී සමාජය විසින් ගොඩනගන ලද ජනශ්‍රැතිමය සාහිත්‍යයක් තුළින් පමණි. ඊට අදාළ සමාජ සම්ප්‍රදායයන් ද ඒ හා බැඳුණු අගයයන් ද සාකච්ඡාවට ලක් කළ හැක්කේත් එකී සාහිත්‍ය තුළින්ම ය. එ බැවින්, පොත පත ඇතුළු මුද්‍රිත ලිපි ලේඛන පරිශීලනය මෙකී අධ්‍යයනයෙහි ප්‍රමුඛතම ක්‍රමවේදය ලෙස ගැනිණ. විවිධ මතවාද ඔස්සේ පැනනැගුණු සංසන්දනාත්මක ඇගයුම් එ මගින් ලැබිය හැකිවීම ඓතිහාසික දත්ත ගවේෂණයක සාධනීය එල මතුකරවන්නකි.

සාකච්ඡාව

මෙහි ශීර්ෂගත කාරණය පිළිබඳ විමර්ශනාක්ෂිය යොමු කිරීමේ දී අපගේ පර්යේෂණාත්මක අවධානය උදුරාගන්නා විෂය ක්ෂේත්‍රයන් කිහිපයක් වෙයි. 'ඓතිහාසික කලා සංකේත' යන්න විෂයමූලික (Objective) කොටගැනීමේ දී එය යම්කිසි අර්ථසම්පන්න අරමුණක් කරා අප මෙහෙය වන අපේක්ෂාවක් බවට පත්වෙයි. ඒ එකකි. ඒ පිළිබඳ විමසා බැලීම තවත් විශේෂ විෂය වපසරින් ද්විත්වයක් ඔස්සේ සිදුකෙරෙන බවත් උක්ත ශීර්ෂය පැහැදිලි කරයි. එ නම්, සංජානනය හා සංඥාර්ථවේදය යි.

යම්කිසි දෙයක, ද්‍රව්‍යයක, වස්තුවක හෝ යම්කිසි රූපමය ස්වභාවයක 'සංජානනමය ප්‍රතිරූපණය' විමසා බැලීමට පූර්වයෙන්, 'සංජානනය' යන්නෙහි අර්ථසම්පන්න භාවය හඳුනාගැනීම ඵලදායක ය. සංජානනය යනු පරිකල්පන උත්පාදනයකි. අදහස් ඉපැදවීමකි. එක්තරා හඳුනාගැනීමකි. එ සේ නැත්නම් සිත මුල්කොටගත් සංවේදී ඉන්ද්‍රිය ක්‍රියාකාරීත්වයකි. යම් දෙයක් ඇසීමෙන්, දැකීමෙන් හෝ දැනීමෙන් ක්ෂණිකව ජනනය කෙරෙන්නා වූ සිතුවිලි සමුදායකි. මෙහි දැනීම යනු ආඝ්‍රාණය, රසය හෝ ස්පර්ශය වෙයි. එසේත් නොවේ නම්, කාලාන්තරයක් තිස්සේ යම්කිසි මිනිස් ප්‍රජාවක් තුළ පැළපදියංව, තැන්පත්ව, කාලානුරූපව වැඩි වර්ධනය වෙමින් පවතින්නා වූ සාංකල්පික ස්වභාවයක් ද විය හැකිය.

> *"සංජානනය පිළිබඳ පුද්ගල සම්බන්ධතාව මානව ඉතිහාසයේ ආරම්භය දක්වාම දිවෙයි. පුද්ගලයා සහ මනස ක්‍රියාකාරීවීම ඇරඹෙන්නේ සංජානන සම්බන්ධතාවකිනි. මිනිසා තර්කානුකූලව සිතා ක්‍රියාකරන්නට පෙර*

*සාමාජික හැසිරීම් සඳහා උත්තේජනය වූයේ සංජානනයෙනි. පංචේන්ද්‍රීය, පරිසරය සහ මනස අන්‍යොන්‍යව ක්‍රියාකාරී වීමේ දී මුල් මානවයාගේ වඩාත් වැදගත් සාධකය වූයේ 'ඥානය නොව' සංජානනය බව වටහාගත හැකි කරුණකි. මෙහි ලා අපට වඩාත් වැදගත් වන්නේ ආසියානු දර්ශනවාදයෙහි ඉගැන්වීම් ය"* (ඇතුගල 1998:1).

ඒ අනුව, එය සිත මුල්කොටගත්තක් බව වඩාත් පැහැදිලි ය. ඇස, කන, නාසය, දිව හා ශරීරිය යන පංචේන්ද්‍රියයන් ඒ හා අත්‍යන්තයෙන් බැඳී පවතින බවත්, ඒ අනුව සංජානනය වූ කලී සෘජුවම ඉන්ද්‍රියගෝචර ක්‍රියාවලියක් බවත් පැහැදිලි කෙරේ. ඒ සඳහා නිශ්චිතව සලකාබැලෙන කොන්දේසි කිහිපයක් පිළිබඳව ද (ඇතුගල 1998:4) සඳහන් වෙයි. එ නම්,

I. සංවේදී ඉන්ද්‍රියයන් (ඇස, කන, නාසය, දිව හා ශරීරිය)

II. පරිබාහිර ගැටීම් (රූප, ශබ්ද, ගන්ධ, රස හා ස්පර්ශ ඇසුරෙන්) සහ

III. සංවේදන (උක්ත ඉන්ද්‍රිය ආරම්මණයන්" කරණකොටගෙන උත්පාදනය වන හැඟීම් හා දැනීම් යනාදී තත්ත්වයන් ඊට අයත් ය.

මීට අදාළව ගොඩනැගුණු හා ගොඩනැගෙමින් පවත්නා බටහිර මතවාද ඊට වඩා වෙනස් අර්ථ නිරූපණයන් ගෙනහැර දක්වයි. සොක්‍රටීස්, ඇරිස්ටෝටල් හා ප්ලේටෝ ආදී සාම්ප්‍රදායික න්‍යායවාදීන්ට වඩා, 'ප්‍රත්‍යක්ෂ' සංකල්පය මුල්කොටගත් ක්‍රියාවලියක් ලෙස සංජානනය හඳුන්වන්නට ඔවුන් උත්සුක වී ඇතැයි හැඟේ. ජෝන් ලොක් (John Locke), බාක්ලේ (Dillux Barkeley) හා හියුම් (Will Humme) යන අනුභූතිවාදීහු එහි දී ප්‍රමුඛ වෙති (Laing and Lee 1966: 211-214).

නමුත්, මෙහි දී අප විසින් ප්‍රස්තුත කොටගනු ලබන්නේ අක්ෂින්ද්‍රීය ප්‍රමුඛ කොටගත් දෘශ්‍ය සංජානනය යි (Visual Perception). නිශ්චිත ඓතිහාසික කලා සංකේත රූපාවලියේ ප්‍රමුඛ වූ සඳකඩ පහණේ සංජානනමය ප්‍රතිරූපණය ඊට විෂයමූලික වෙයි. 'සංඥාර්ථවේදය' එකී සංජානනමය ප්‍රතිරූපණය විමසා බැලෙන දෘෂ්ටිමය ප්‍රතිපදාව යි. ඒ අනුව, මීළඟට 'සංඥාර්ථවේදය' යනු කුමක්දැයි හඳුනා ගැනීම අත්‍යවශ්‍යයෙන්ම කළ යුත්තකි.

සංඥාර්ථවේදය (Semiology) යනු පශ්චාත් නූතන ලෝකය පිළිබඳ ශාස්ත්‍රීය ආමන්ත්‍රණයෙහි ලා වඩාත් ඵලදායක විෂය ප්‍රවේශය යි. බොහෝ දේ පිළිබඳ සාවද්‍ය අර්ථකථන සැපයෙමින් පවත්නා නූතනයක වඩාත් ශාස්ත්‍රීය සම්පන්න, විද්‍යාත්මක ප්‍රවේශයක් (Classical and Scientific Approach) සහිත දෘෂ්ටිමය ප්‍රතිෂ්ඨාවක් ලෙස ගිනිය හැකි න්‍යාය ධර්මය යි. කවර නම් වූ ස්වරූපයක් වුව සන්නිවේදනමය ඵල විමර්ශනයේ දී ශාස්ත්‍රීයමය වශයෙන් වඩාත් බලපෑම් සහගත වූ ත්, විෂයයික වශයෙන් නිරවද්‍යම වූත් ආස්ථානයක් ප්‍රකට කෙරෙනුයේ ඒ තුළ බැව් මේ වනවිටත් හඳුනාගෙන අවසන් ය (Saussure 1978:41).

ඉතාම සංක්ෂිප්තව හඳුන්වා දෙන්නේ නම්, - ඊට අදාළ නොවන සන්නිවේදන ක්‍රියාකාරකමක් පිළිබඳ සිතීම උකහට ය. යම්කිසි වචනයක, රචනයක, කවියක. කථාවක, ගීතයක හෝ වෙනයම් ලේඛනයක, එසේත් නැත්නම් යම්කිසි රූපයක, චිත්‍රයක, මූර්තියක, කැටයමක හෝ නැටුමක, නර්තනයක, චිත්‍රපටයක, නාට්‍යයක වුව සන්නිවේදනාර්ථ සාකච්ඡා කිරීමේදී වඩාත් වැදගත් වනුයේ සංඥාර්ථවේදය යි. තිතක්, සරල රේඛාවක්, වක්‍රයක්, වෘත්තයක්, චතුරශ්‍රයක් හෝ වෙනයම් ඕනෑම හැඩයක් හෝ ස්වරූපයක් ද ඊටම අදාළ ය. ඒ අනුව, සංඥාර්ථවේදය වූ කලී සකල විධ ස්වභාවයන්හි සන්නිවේදනාර්ථ නිරීක්ෂණයෙහි ලා උපස්ථම්භක කොටගත හැකි විද්‍යාත්මක භාවිතය ලෙස අවිවාදිත ය (නානායක්කාර 2012:30). සංඥාර්ථවේදය, ප්‍රායෝගික විග්‍රහාත්මක විද්‍යාවක් ලෙස නූතනය හා එ තරම්ම බැඳී පවතියි.

සමාජවිද්‍යාත්මක, මනෝවිද්‍යාත්මක හා මානව විද්‍යාත්මකව ද ඉදිරිපත් කළ හැකි යම් යම් විශ්ලේෂණයන්, ඉන් ඔබ්බට විහිදුණු ගැඹුරු ව්‍යාඛ්‍යානවේදී එළැඹුම් දක්වා (to the narratological Approaches) ගෙන යන්නට සංඥාර්ථවේදයට ඇති ශක්‍යතාව අනල්පය. ඓතිහාසික කලා සංකේත යනු එක්තරා ආකාරයකට ගත්කල ද්‍රව්‍යමය ආස්ථානය කි. නිදසුන් ලෙස, සඳකඩපහණට අනුව එහි තාක්ෂණමය හා කලාත්මක මූලධර්මයනට ඔබ්බෙන් වන සමාජ

සන්නිවේදනාත්මක විෂය වපසරිය අතිශය පුළුල් ය. එක්තරා අතකට එය කාලීන සංස්කෘතිකමය පිළිබිඹුවකට (Contemporary cultural reflection) වඩාත් සමීප වෙයි.

සමකාලීන කලාකරුවා හා සමාජය පිළිබඳ එයින් නිෂ්පන්න අර්ථ සමුදාය කො තෙක් ද? අදාළ කලාකරුවාගේ පුද්ගල විඥ්ඥාණය හා එ වකට පැවැති සමාජය පිළිබඳ එහි ප්‍රතිරූපණය කවරාකාර ද? යන්න එහි දී වඩාත් වැදගත් වේ. හුදු පුරාවිද්‍යාත්මක ඇගයුමකට වඩා පැතිරුණු, ගැඹුරු විශ්ලේෂණාත්මක දෘෂ්ටියක් එ මගින් සම්පාදනය කෙරෙන බව අවධාරණය කිරීම අතිශයෝක්තියක් නොවේ. ඒ අනුව ගත්කල ද්‍රව්‍යමය, භෞතිකමය හෝ වාස්තුවික ස්වභාවයන් විග්‍රහයෙහිලා සෙසු ප්‍රවේශයන්ට වඩා සංඥාර්ථවේදී ප්‍රවේශය වඩාත් සූක්ෂම වන බැවින් ඓතිහාසික කලා සංකේත රූපාවලිය තුළ ප්‍රකටීභූත සංජානනමය ප්‍රතිරූපණය පිළිබඳ විග්‍රහයෙහි දී ද සංඥාර්ථවේදී දෘෂ්ටිකෝණයේ යුක්තිසහගත බව පසක් කළ හැකිය.

සංඥා හා සංකේත යනු මානව සන්නිවේදනයේ ප්‍රාරම්භක සීමාවේ පියවරයන් ය. අදහස් ප්‍රකාශ කිරීමෙහි ලා නොදියුණු මානවයා යොදාගත් ක්‍රමවේදය එය යි. ඉර, හඳ, මල්, සත්ත්ව රූප, මිනිස් රූප සහ වෙනත් විශේෂ ද්‍රව්‍යය ආදිය සිතුවමට නැගීමෙන් ඉටුකරගන්නා ලද අදහස් ප්‍රකාශනය පසුකාලීන වඩාත් සියුම් විධිමත් භාෂාවක් (Formal language) කරා මෙන්ම, අනතුරුව විද්‍යාව හා තාක්ෂණය සමග බැඳුණු විද්‍යුත් ප්‍රකාශනයන් (Electronic expression) දක්වාත් විදාරණය කෙරිණි.

ඒ අතරතුර වූ මානව ක්‍රියාවලිය තුළ නිර්මිත සංකේතානුසාරී කලාකෘති මෙහි දී අපගේ විශේෂ අවධානයට යොමු වෙයි. පුරාණ අනුරාධපුර, පොළොන්නරු සම්ප්‍රදායයන්හි නිර්මිත ගල්, ලී හා ඇත්දත් ආදී මාධ්‍යයෙහි විශේෂ කලකෘති එහි දී නිදසුන් කොට ගනිමු. පුරාවිද්‍යාත්මක නටබුන්' ලෙස නූතන ජනවහර තුළ ප්‍රකට සඳකඩපහණ, මුරගල්, ඉර, හඳ, මල්කම්, ලියකම්, හංස, සිංහ, ඇත්, අස්, ගව, නාග, මකර, කිඳුරු, ගජසිංහ, ගුරුළු, භේරුණ්ඩ පක්ෂි ආදී වෙනත් සත්ත්ව රූප ද මේ අතර බහුල ය.

අපි 'සඳකඩපහණ' ගනිමු. සහශ්‍ර සංඛ්‍යාත වර්ෂාධික කාලයක් මානවයා අතර අභිවාදනයට ලක්වෙමින් පවත්නා මේ අග්‍රගණ්‍ය සෙල්මුවා නිමැවුම සකල මානව සංහතිය අධ්‍යාත්මයෙන් ඥානනය කරන්නක් නොවේ ද? කුමක් නිසා ද? එහි පවත්නා චිරකාලීන ගැඹුරු බෞද්ධ දාර්ශනික සත්‍යය මිනිස් අධ්‍යාත්මයේ පත්ල ආමන්ත්‍රණය කරන බැවිනි. සාංසාරික ගමනාන්තරය තුළ ලෞකික සුඛය කෙරෙහි ලොල්ව ලෝභ, ද්වේෂ, මෝහාදී ක්ලේශයෙන් මුසපත් මිනිස් සිත් පත්ල ස්පර්ශ කරන බැවිනි. එහි ඇති පලා පෙතිවලින් අග්නිජාලාව නිරූපණය වන බවත්, ඉන් රාග ද්වේශ මෝහ යන කෙලෙස් සංකේතවත් වන බවත්, සතුන් හතර දෙනාගෙන් සතර බියත්, ලියවැල් වලින් තෘෂ්ණාවත්, හංස පේළිවලින් පාරිශුද්ධියත් නෙළුම් මලින් පරම නිවනත් සංකේතවත් වන බව චිරප්‍රකට සරල අදහසකි (විජේසේකර 1963:30).

ප්‍රස්තුත සංඥාර්ථවේදයට අනුව, 'සඳකඩපහණ' වූ කලී සංඥාකාරක පද්ධතිය (Signifire system) කි. සංඥාකාරකය යනු හැඟවුම්කාරකයක් හෙවත් හැඟීම් උත්පාදකයකි. එය යම්කිසි අදහසක් නිෂ්පන්නවීමෙහිලා මූලික පදනම යි. එය ද සංකේතානුසාරී ය. මෙය පැහැදිලි කිරීමෙහිලා පහසු විය හැකි ග්‍රාෆික සටහනක් අපට පොතපත ඇසුරෙන් (විජේතුංග 1994:14-15) සපයාගත හැකි ය (සටහන 1).

-ලිඛිත භාෂාවේදී 'සයුර' යන්නෙන් අප කඩදාසියක ලියන විට එය සංඥාකාරකයක් වේ. මී ළඟට සයුර යන්නෙහි අර්ථය නැත්නම් සංඥාකෘත්‍යය (හැඟවුම) වන්නේ කුමක් ද? ජලයෙන් පිරුණු විශාල ප්‍රදේශයකි. වර්ෂාව යන්නෙන් අප තුළ ඇති කරන සංඥාකෘත්‍යය, අහසින් ගලා හැලෙන වැහි බිඳු රැසකි. සයුර යනුවෙන් අප භාෂාවේදී භාවිත කරන වචනය මුළුමනින්ම පාහේ සම්මත අරුතකි දනවන්නේ. වචන තනිතනිව ගත්කල ඒවායේ තේරුමක් නැත. සංඥාකාරක මට්ටමේ සයුර යන්නේ තේරුම ව්‍යුත්පන්න වන්නේ මයුර, සොයුර, පවුර ආදී අනෙක් සමාන ශබ්ද හා සැසඳීමෙනි.

සයුර යන්නෙන් අපට හැඟවෙන දෙය නැත්නම් සංඥාකෘත්‍යය (හැඟවුම) ගංගාව, දිය ඇල්ල, කලපුව, විල, දියකඳුර ආදියෙන් සයුර වෙන්කර හඳුනා දෙයි. භාෂාව දෙයාකාරයකට තේරුම් ගොඩනගා දෙන

බව සංඥාර්ථවේදීහු පෙන්වා දෙති. එ නම් කිසියම් වචනයකින් කියැවෙන පදානුගත අර්ථය හෙවත් පාවිච්චි කිරීම තුළින් ඊට ලැබෙන තේරුම් ය" (විජේතුංග 1994:15).

මේ අනුව, සඳකඩපහණෙහි උපරිව්‍යුහය හෙවත් මතුපිට ස්වභාවය තුළ ප්‍රකටිභූත අර්ථය සංඥාකාරකයක් හෙවත් හැඟවුම්කාරකයකි. නො එ සේ නම් හැඟවුම්කාරක පද්ධතියකි. සාමාන්‍ය ගැමියා මෙන්ම විවිධ විද්වතුන් ද විවිධ අරුත් සපයනුයේ උක්ත හැඟවුම්කාරකයන්ට අනුව ය. එකී හැඟවුම්කාරක, සමාජමය ගුණවාචක ලක්ෂණයන්ගෙන් යුක්තය. ගුණවාචක (Connotation) යනු යම්කිසි ගුණයක් පිළිබිඹු කෙරෙන පදමූලයකි. නමුත්, "ගුණවාචක ලක්ෂණ ඇත්තේ වචනවලට පමණක් නොවේ.

සංඥාකාරක හා ගුණවාචක මගින් සංජානනය කෙරෙනුයේ නෙළුම් මල වූ කලී ලෝකෝත්තර විෂයයෙහි ප්‍රවේශ විය හැකි උත්තරීතර වූත්, ශ්‍රේෂ්ඨ වූත්, පරම සුඛය වූ නිර්වාණය (Paranawithana 1966:131) ලෙසයි.

පශ්චාත් නූතනය තුළ එක් පසෙකින් සමාජාභ්‍යන්තරයෙහි කැකැරෙමින් පවත්නා ඉච්ඡාභංගත්වය ඇතුළු අසහනකාරී දෛනික ගැටලුත්, අනෙක් පසින් සියුම් අධ්‍යාත්මය ගැඹුරින් අවබෝධ කොට ගන්නා අපිස්බව ඇතුළත් ආත්මීය ඥාන ප්‍රබෝධයත් මෙහි දී කැපී පෙනේ. උක්ත ඥාන ප්‍රබෝධය හා සැසඳිය හැකි අතිශ්‍රේෂ්ඨ වූ ශ්‍රී සම්බුද්ධෝත්පත්තිය ප්‍රකාශ කිරීමෙහිලා ද, තවත් තැනෙක 'සුදුපියුම' සංඥාකාරකයක්

**සටහන 1.**




ප්‍රතිරූප (Images) ගුණවාචක ලක්ෂණ ගෙනඑනු ලබයි"(විජේතුංග 1994:17). ඒ අනුව සංඥාකාරකයක් හෝ සංඥාකාරක පද්ධතියක් තුළ පවත්නා ගුණවාචක සමුදායකි.

භාවවාචක (Denotation) පිළිබඳව ද ඊළඟට අවධානය යොමුකළ යුතුය. එ නම්, ගුණවාචකයෙන් ප්‍රතිරූපණය කළ දේ තවදුරටත් භාවමය ගැඹුරක් දක්වා ගමන් කරවීමෙහි ලා පාදක වෙන ස්වභාවයක් ය. සඳකඩපහණ වූ කලී සංඥාර්ථවේදයට අනුව ගත් කල, ගුණවාචී මෙන්ම භාවවාචී අර්ථ සම්පාදන ශක්‍යතා බහුල පිරිපුන් කලා කෘතියකි. නිදසුන් ලෙස නෙළුම් මල ඇතැම් තැනෙක හඳුන්වනු ලබනුයේ පවිත්‍රත්වයේ සංකේතයක් ලෙසිනි. පිවිතුරු සුන්දරත්වය අරුත්ගන්වන සුපිපුණු සියපත ඉපැදීමේ හා ප්‍රකාශනයේ සංකේතයක් ලෙස ප්‍රකට කලා විචාරකයෝ හඳුන්වාදෙති (Coomaraswam 1935:59). නමුත්, සඳකඩපහණ

කොට ගැනේ. මේ ගේය පද්‍ය කාණ්ඩය කියවමු.

*"වෙසඟේ අරුණලු කැන් දිලුනා*

*මිහි මව තුටු කඳුළින් තෙමුනා*

*දහසක් සක්වල සාධුනාද නැගුනා*

*තුන්ලොවම සුවඳ කළ*

*රමණීය පියුම පිපුණා ...." (හේමරතන 2011:45)*

සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය ගැන කියැවෙන මෙහි, වාච්කව නොකියැවෙන පුවත ද එයම ය. බොදු පරිසරයෙන් උකහාගත් භාවපූර්ණ ඉන්ද්‍රිය රූපයන් භාවිතයෙහි ලා උන්වහන්සේ දක්වන ප්‍රශස්ත ශක්‍යතාව එහි විද්‍යමාන ය. රූපකාර්ථවත් භාෂාව තුළ ගොඩනැංවෙන ව්‍යංගය මෙහි විශිෂ්ටතම කාව්‍යාලංකාරයක්

ලෙස කුළුගැන්වෙන අයුරු අතිශය ප්‍රශංසනීය වෙයි. සාර්ථක ගේය කාව්‍ය පබඳුවකු සතුවිය යුතු ව්‍යංජන ශක්‍යතාව මෙකී නිර්මාණයට ආලෝකයක් වූ අයුරු අපූරු ය. සිද්ධාර්ථ කුමාරොත්පත්තිය උන්වහන්සේ හඳුන්වන්නේ "... *තුන් ලොවම සුවඳ කළ රමණීය පියුම පිපුණා...* යනුවෙනි" (නානායක්කාර 2012:13)

පොරණ හෙළ කලාකරුවා සඳකඩපහණ කලා කෘතියෙහි අර්ථෝද්දීපනය සඳහා දායක කොටගත් නෙළුම් මල එ බන්දකි. බෝධිසත්වයින් වහන්සේ මහමයා දේවියගේ කුස පිළිසිඳගන්නට පෙරාතුව සුදු ඇත්පැටවෙක් සුදු නෙළුමක් සොඬින් ගෙන, දේවින්වහන්සේගේ යහන් ගබඩාව පැදකුණු කළ බවක් ද, වෙසක් පුන්පොහෝදා ලුම්බිණි සල් උයනේ සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය සිදුවෙද්දී හාත්පස සත් පියුම් පිපුණු බවක් ද අප අසා ඇත. ඒ බුද්ධාලම්භන ප්‍රීතිය සාහිත්‍යයට නැගුණු සැටියකි. ඒ උතුම් පුණ්‍යවන්ත සමාජ පෙරළිය සංකේතවත් කරන්නට තරම් නෙළුම් මල සංඥාවක් වූ අයුරු අපූරු ය. ජනශ්‍රැතිය තුළ නෙළුම් මල කෙරෙහි ප්‍රවේශ වන්නා වූ ශ්‍රේෂ්ඨත්වය එ බඳු ය.

විශ්ව නිර්මාණයේදී 'ජීවය' සතු 'ස්වයංභූ' බලවේගය පෙන්වූයේත් නෙළුම් මලෙනි. ජලය, ස්ත්‍රීවාචී අර්ථයෙහි යොදන හින්දු මතයට අනුකූලව නෙළුම් මල එහි ප්‍රජා උත්පාදක ඉන්ද්‍රිය ලෙස සැලකේ. 'ලෝකය මැවූවා' යි කියන 'බ්‍රහ්මයා' ගේ උත්පත්තිය පවා නෙළුමෙන් ඇතිවූවක් ලෙස ගැනේ. මේ නිසාම 'භූමිදේවි' යන නමින් ද 'නෙළුම' හැඳින්වෙයි. ඍග්වේදයේ භූමිදේවිය හැඳින්වෙන්නේ 'ශ්‍රී ලක්ෂමී', 'පද්ම සම්භවා' හා 'පද්මිණී' යන නම්වලිනි"(අභයරත්න 1961:45).

වේදයුගයෙන් පසු, එ නම් බුදුසමයෙහි දී නෙළුම්මල් සංකේතය යෙදුනේ 'අතිඋත්තම' යන අදහස් ප්‍රකාශ කිරීමට බවත්, 'සිදුහත් උපත' පිළිබිඹු කරන කලාකරුවා සාංචි දොරටුවේ 'කුමරු' වෙනුවට නෙළුම් මල යෙදුවේ 'උත්තම', 'පිරිසිදු' යන හැඟීමක් දීමට බවත්, එ මෙන්ම, බුදුන් දක්විය යුතු තැන පවා කලාකරුවා පද්ම සංකේතය යෙදුවේ උතුම් හැඟීම ලබාදීමට බවත් ප්‍රකට කාරණයකි (අභයරත්න 1961:42-51).

එ බඳු දීර්ඝකාලීන සමාජ සම්බන්ධතාවක් සහිත වස්තුවක් සංඥාර්ථවේදය තුළ ප්‍රබල සංඥාකාරකයකි. නැත්නම් ප්‍රබල සංඥාකාරක පද්ධතියකි. මේ අනුව සඳකඩපහණ නිර්මාණකරුවා ස්වකීය සන්නිවේදනයෙහි ලා විෂයමූල කොටගත් අදහස (Objected idea to communicate) ප්‍රතිෂ්ඨාපනය (Establish) කිරීම සඳහා මුලින් කී ගුණවාචක හා භාවවාචක සහිත පිරිපුන් සංඥාවන් භාවිත කිරීම කෙතරම් අපූරු ද? එහි අර්ථසම්පන්නභාවය වඩාත් කුළුගැන්වෙනුයේ කලාකරුවා අපේක්ෂිත සංජානනමය ශක්‍යතාව එළදරන්නේ නම් පමණි. එකී අපේක්ෂාව මේ තුළින් ඉටු වී ඇති අපූරුව සැබැවින්ම විස්මජනක ය.

බ්‍රිතාන්‍යයේ ජෝන් ලොක් විසින් වෙසෙසින් කුළුගන්වන ලද -ඥානවිභාගය සහ සංජානනය පිළිබඳ න්‍යාය" (The theory of knowledge and perception) තුළින් අවධාරණය කරනුයේ යම්කිසි සංජානනමය ප්‍රතිරූපණයක් උදෙසා, කේන්ද්‍රීය ද්‍රව්‍යය, තත්ත්වය හෝ ස්වභාවය ඉන්ද්‍රියගෝචර විය යුතුම බවයි (Russell 1985:49). අදාළ සාමාජිකයා සතුව පවත්නා පෞද්ගලික විඥ්ඥාණමය ස්වභාවය හා සංස්කෘතිකමය බැඳියාවන් (Personal consciousness and cultural relatives) ඒ සඳහා අත්‍යන්තයෙන් බලපාන බව ද ඔහු අවධාරණය කරයි (Russell 1985:49). ඉන් ප්‍රකාශිත අර්ථ සමුදාය පුද්ගල විභින්නතා අනුව (Depending on individual differences) තීරණය කළ යුතු බව හියුම් සහ බාක්ලේගේ අදහස (Humme and Barcklay 1969:13)යි.

සඳකඩපහණ තවදුරටත් අරුත් ගැන්වීමෙහි ලා ආනුශාංගික හංස රූපය නිදසුන් කොට ගනිමු. විවිධ දර්ශනවාදයන් තුළ හංසයා කෙරෙහි ප්‍රකට කෙරෙන වෙසෙස් ප්‍රමුඛස්ථානය කෙ සේ වුව, දේශීය ජනවිඥ්ඥාණය තුළ හංසයා කෙරෙන් ගොඩනැගී ඇති සාංකල්පික ආස්ථානය විමසීම වටී. බෞද්ධ සිද්ධස්ථානයන් හි ප්‍රකට සඳකඩපහණට අමතරව, වටබැමි, ගල්කණු, පේකඩ ආදියෙහි එය සුවිසෙස්ව දක්වෙයි. හින්දු මතයට අනුව, මැවීමේ නියාය ගැබව පවත්නේ හංස රූපය තුළ ය. හංසයා බ්‍රහ්මයාගේ වාහනය ලෙස ගැනෙන්නේ ද එ බැවිනි. හින්දුමතය, බෞද්ධ සංකල්පනාවට සමීප වනුයේ, හංසයා, නොකිළිටි එ මෙන්ම අතිශය පවිත්‍රත්වයේත්, ආධ්‍යාත්මික විමුක්තියේත් රූපක සංකේතය ලෙස

සැලකීමෙනි (අභයරත්න 1961:46).

වීදාගම මෛත්‍රී හිමියන් විසින් විරචිත චිරප්‍රකට හංස සංදේශ කාව්‍යයේ ආසිරි ගීයෙහි හංසයා වැනෙනුයේ 'සැරදෙ හසරද සඳ - පුන්සඳ පහන් පිරිසුදු' යනුවෙනි. එයින් අර්ථවත් කෙරෙන්නේ 'පූර්ණ චන්ද්‍රයාගේ ප්‍රභාව මෙන් පාරිශුද්ධ වූ හංස රාජෝත්තමයාණෙනි, ඔබ චිරාත් කාලයක් ජීවත් වේවා' (සේනානායක 1978:49) යන්න යි. හංසයා එබඳු උත්තුංග පාරිශුද්ධත්වයකට හිමිකම් කියන චරිතයකි. එහි දූත වර්ණනයෙහි එන පරිදි, හංසයා වූ කලී දියරෙන් කිරි වෙන්කොට ගත හැකි, එ මෙන්ම මහා බ්‍රහ්මයා ස්වකීය තුන්ලෝ චාරිකාව උදෙසා වාහකය කොටගත්තා උතුම් සත්වකෙනෙකි.

*"තොප තුඩ තුළට කිරි රස දිය හැර වදිය*

*තොප පිට පිහිට කැරැ බඹ තෙදිය ඇවිදිය" (සේනානායක 1978:17)*

සඳකඩපහණ මධ්‍යයේ ඇති අර්ධ කවාකාර පද්මය වටා හංසවැල දක්නට ලැබෙයි. හංසවැලට අමතරව ලියවැල ය. ඒ අනුව හංසවැල දක්නට ලැබෙනුයේ ලියවැලත්, පද්මයත් අන්තරයෙහි ය. ලියවැලින් තෘෂ්ණාව ද, අඩ පියුමෙන් පාරිශුද්ධත්වය නොහොත් ශ්‍රද්ධා වාසය ද සංකේතවත් කෙරෙතැයි මහැදුරු පරණවිතානයෝ අදහස් කරති. *"හංස පෙළින් රූපකාර්ථවත් වනුයේ සත්ත්වයා තෘෂ්ණාව මැඩ පාරිශුද්ධත්වය කරා ගමන්කරන බවය"* (පරණවිතාන 1961:231). විශුද්ධිය උදෙසා දරන ප්‍රයත්නයෙහි සංජානනීය සංඥාව හංසයා ය. හෙළ බොදු සංස්කෘතික අර්ථ නිරූපණයක් ලෙස එහි පවත්නා යෝග්‍යතාව අනල්ප ය. එ බැවින්ම, සංජානනය පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයන්හි දී එබඳු දේ "ජනරූප" ලෙස හැඳින්වෙයි.

*"කිසියම් ජනරූපයක් සමූහ පිළිගැනුමකට භාජනය වූයේ සංකේතයක් හා කිසියම් අත්දැකීමක් එම රූපයට එකතු වූ විට ය. එබඳු ජනරූපයක් සමාජයක වඩාත් අර්ථවත් වන්නේ ද්විතීය උපතකිනි. එ නම්, කිසියම් පුද්ගලයෙක් හඳුන්වාදෙන ජනරූපයක්, ජනසමූහයක් අතර භාවිතයෙන් ද්විතීය උපතක් ලබන බවයි. මෙය ජනශ්‍රැතියටත් පොදු ධර්මතාවකි. ද්විතීය උපතකින් පසු එය සමූහ විඥ්ඥාණයක් ප්‍රකට කරයි. එවන් ජනරූප අපට හඳුනාගත හැක්කේ සංඥා හා සංකේත, සාම්ප්‍රදායික ශාරීරික භාෂා හා අවාචික සන්නිවේදන විධික්‍රම, ජනකතා හා ප්‍රාථමික සන්නිවේදන ක්‍රම යනාදිය අධ්‍යයනයෙනි"* (ඇතුගල 1998:143).

යම්කිසි සංජානනමය ප්‍රතිරූපණ ක්‍රියාවලියක සමාජගතවීම පියවර කිහිපයක් ඔස්සේ සිදු කෙරෙන බව පැහැදිලි කළ හැකියි. එනම්, තෝරාගැනීම, සැසඳීම හා අර්ථ දක්වීම යි (සටහන 2). ඊට අදාළ එක් එක් සමාජ සාධක ඒ සමගම බැඳී පවතියි.

*"එය වඩාත් හොඳින් තේරුම් ගැනීමට නම් යම් සංස්කෘතියකින් ඒ සඳහා ආරෝපිත අර්ථ වටහාගත යුතු වේ. එනම්, වඩාත් හොඳින් ජනරූප අර්ථවත් වන්නේ, ඒවා උපන් සමාජ සංස්කෘතික පරිසරයන්හිම ය"* (ඇතුගල 1994:143)

දෘශ්‍ය මාධ්‍ය පිළිබඳ කෘතහස්ත සිද්ධාන්තවේදියෙකු වූ රුඩොල්ෆ් ආන්හයිම්ට අනුව, සංජානනීය ප්‍රශස්තතා මත බිහිවන ජනරූප කෙරෙහි වැඩි වටිනාකම් හිමි වේ (Arnheim 1969:22-46). එය, රූප තක්සේරුව (Visual evaluation) තුළින් සිදු කෙරෙන්නක් බවත්, එහි දී ප්‍රමුඛකොට ගැනෙන කොන්දේසි දහයක් හඳුන්වා දිය හැකි බවත් තවත් අදහසකි (පල්ලිගුරු 1999:23).

1. සමබරතාව (Balance)
2. හැඩය (Shape)
3. ආකෘතිය (Form)
4. අවකාශය (Space)
5. වර්ධනය (Growth)
6. ආලෝකය (Light)
7. වර්ණය (Colour)
8. ආතතිය (Tension)
9. චලනය (Movement)
10. ප්‍රකාශනය (Expression)

යනු ඒවා යි. හුදෙක් ඇසට ගොදුරු වන බාහිර සාටෝපය වෙනුවට ගැඹුරු රූප

(සටහන 2)




විඥ්ඥාණය ද, එය ඉක්ම වූ අර්ථ විඥ්ඥාණය ද සඳහා අවශ්‍ය සංජානනමය පසුබිම ස්ථාවර ජනරූපයක පවතියි. එහි දී හුදු භාෂාමය සීමාවන් සුමට ලෙස සමතික්‍රමණය කොට, රූපමය වශයෙන් නව අරුත් සම්පාදනය හා ප්‍රතිනිෂ්පාදනය කරමින් අදාළ සංජානනීය ප්‍රතිරූපණය සිදු කෙරෙනු ඇත. නිර්මාණ ශිල්පියා සතු සංවේදනමය, ප්‍රත්‍යක්ෂණමය හා සංජානනමය ශක්‍යතාවන් ඊට පිටුබල වෙයි (නානායක්කාර 2012:84).

## නිගමනය

දේශීය ජනමනස තුළ ස්ථාපිත ජනරූප සම්ප්‍රදායයෙහි අග්‍රප්‍රාප්ත සඳකඩපහණ අර්ධ කවය මධ්‍යයෙහි වූ පියුමත්, ඒ හා බැඳුණු මල්කම්, ලියකම්, ඇත්, අස්, සිහ, ගව හා හංසාදී සත්ත්ව රූපත් කෙරෙන් දනවන අරුත් මානව අධ්‍යාත්මය පුබුදුවාලන්නට සමත්වෙයි. ප්‍රශස්ත කලා සංකේත සම්ප්‍රදායක සංජානනීය ප්‍රතිරූපණය, අන්ධකාර අධ්‍යාත්මයක සැරිසරන මිනිසාට ප්‍රදීපාලෝකයක් බඳු යැයි සිතිය හැකි වන්නේ එ බැවිනි.

ඒ අනුව, ඓතිහාසික කලා සංකේත රූපාවලියක නිර්විස්න ඒකාබද්ධතාවක් ලෙස සැලකිය හැකි 'සඳකඩපහණ', හෙළ බොදු සංස්කෘතිය තුළ පමණක් නොව, සමස්ත ආධ්‍යාත්මික ලෝකය තුළ චිරකාලීන ලෙස ස්ථාවර වූ ජනරූපයක් බවට පත්ව ඇති වග විශද වෙයි. පරිබාහිර දෘශ්‍ය පරාසය තුළ විද්‍යමාන රූපමය හැඩතල හා සරල අරුත් වෙනුවට, ජන අධ්‍යාත්මය ආමන්ත්‍රණය කළ හැකි ගැඹුරු ශාස්ත්‍රීය ධර්මතා හා රිද්මීය ලක්ෂණ එහි අනන්‍යතා බවට පත්වෙනු පෙනේ. මෙකී සකලවිධ නිර්මාණාත්මක සංලක්ෂණ හේතු යුක්ති සහිතව පිරිසිඳ පසක් කළ හැකි වනුයේ එකී රූපාවලිය තුළ ප්‍රකටීභූත සංජානනමය ප්‍රතිරූපය පිළිබඳ සංඥාර්ථවේදී විමසුමක් තුළින් පමණක් බව අවසානයේ නිගමනය කළ හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛන නාමාවලිය

අභයරත්න, හේරත් එම්. (1961) ලංකා කලා සංකේත කිහිපයක්, ***සංස්කෘතික ත්‍රෛමාසිකය,*** 9 කලාපය, 3 සඟරාව (සංස්. කේ. සී. පෙරේරා හා පියදාස මහින්දසිරි), සංස්කෘති ප්‍රකාශනයක්, කැලණිය.

ඇතුගල, ආරියරත්න (1998) ***සංජානනය සහ සත්තිවේදනය : දෘශ්‍යමාධ්‍ය පර්යේෂණය,*** සීමාසහිත එම්. ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

නානායක්කාර, සේන (2012) ***පොතක මහිම,*** එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

නානායක්කාර, සේන (2012) බොදුගීතය, බැතිය හා සදාචාරවර්ධනය පිළිබඳ සංඥාර්ථවේදී විමසුමක්, ***ජනමාධ්‍යවේදය,*** (සංස්. ආචාර්ය ධර්මකීර්ති ශ්‍රී රන්ජන්) , මාධ්‍ය පර්යේෂණ හා ප්‍රකාශන අංශය, ශ්‍රී පාලි මණ්ඩපය, හොරණ.

නානායක්කාර, සේන (2012) ***මාධ්‍යකලා විචාර ප්‍රතිචාර,*** එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

පල්ලියගුරු, චන්ද්‍රසිරි (1994) රූප තක්සේරුව, ***ලංකා කැමරා*** (සංස්. උදිත ගයාෂාන් ගුණසේකර) 1999 ගිම්හාන කලාපය, ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය, කොළඹ.

විජේතුංග, ගාමිණී (1994) සිනමාව, සංස්කෘතිය හා මතවාදය, ***සංඥාර්ථවිද්‍යාව,*** පද්මා විජේතුංග ප්‍රකාශනයක්, නුගේගොඩ.

විජේසේකර, නන්දදේව (1963) ***ලංකාවේ පැරණි ශිල්පකලා - සඳකඩපහණ,*** ලංකාණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

සේනානායක, ජී. එස්. බී. (1978) ***හංස සංදේශ සංස්කරණය,*** ප්‍රදීප ප්‍රකාශකයෝ, කොළඹ.

හේමරතන හිමි, පල්ලේගම (2012) ***සීතල ගඟුල වගෙයි,*** කර්තෘ ප්‍රකාශනයක්, කොළඹ.

Arnheim, Rudolf (1969) ***Visuals in Folkform,*** Good Wing Collection, Los Angalis.

Coomaraswamy, Ananda. K (1935) ***Element of Bhuddist Iconography,*** Cambridge Moss.

Laing, R.D., Philipson, S. and Lee, A.R. (1966) ***International Perception: A Theory and a method of research,*** Harper and Row, New York.

Paranawithana, Senarath (1961) The Significance of Sinhalese Moonstone, ***Artibus Asia xvii,*** , Cultural Department, Colomo.

Russelle, Bertrand (1985) ***Perception, Knowledge and Mind: An Overview on Western Philosophy,*** Unwin paperbacks, London.

Saussure, Ferdinand, D. (1978) ***Fundamentals of Semiology,*** Hill and Wang, New York.

Humme, Wille and Barcklay, Dillux (1969) ***Communication and Perception,*** Pelicon Books, London.